# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
**Ministry of Women, Child Affairs and Social Security – Social Security Division**


| මගේ අංකය / எனது இல / My No | DSD/HO/04/ER/09/කඩිනම් සමෘද්ධි ගෙවතු | ඔබේ අංකය / உமது இல / Your No | ......................... | දිනය / திகதி / Date | 2020.03.25 |
|---|---|---|---|---|---|

දිස්ත්‍රික් ලේකම්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ,

සමෘද්ධි කළමනාකරුවන්,

සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**"සෞභාග්‍යයේ දැක්ම"**

**සමෘද්ධි ආදර්ශ ගෙවතු සංවර්ධන වැඩසටහන - 2020**

වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබල ගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනයක් බවට පත් කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වේ.

02. "සෞභාග්‍යයේ දැක්ම" තේමාව යටතේ නව රජය මගින් මෙහෙයවන ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයේ උපදෙස් මත කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් මෙම **සමෘද්ධි සෞභාග්‍යයේ** දැක්ම ගෙවතු වගාව වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව 2020 වර්ෂයේ දී සියළුම සමෘද්ධි සහනාධාරලාභීන් දායක කරගෙන ඔවුන් සවිබල ගැන්වීමේ ඉලක්ක ඇතිව මෙම ගෙවතු වගා වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු වේ. මේ සඳහා සියළුම සමෘද්ධි සහනාධාරලාභීන්ගේ දායකත්වය අනිවාර්යයෙන් ම ලබාගත යුතු අතර මේ සඳහා අඩු ආදායම්ලාභීන් සහ සමෘද්ධි බැංකු සාමාජිකයන් ද දායක කර ගැනීම වැදගත් වේ. මෙම වැඩසටහන මඟින් පවුලේ පෝෂණය ඉහළ නැංවීම, ආහාර සුරක්ෂිතාවය තහවුරු කිරීම, පවුලේ ජීවන වියදම් අවම කිරීම, අතිරේඛ ආදායම් මාර්ගයක් පවුල් ඒකකයට ඇති කිරීම හා වස විසෙන් තොර පරිසර හිතකාමී නිෂ්පාදනයට ප්‍රජාව හුරු කරන අතර පවුලේ අතිරික්ත ශ්‍රමය ඵලදායී නිෂ්පාදන කටුයුත්තකට යොමු කිරීම මෙන්ම පෝෂ්‍යදායී ආහාර වේලක් ලබාගැනීමට අවස්ථාව සලසා දීම අපේක්ෂා කෙරේ. මෙහිදී වගාවන් සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති නාගරික හා අර්ධ නාගරික ජනතාවගේ ගෙවතු සඳහා බඳුන් වගාව ඇතුළු නව නාගරික කෘෂි කාර්මික තාක්ෂණ ක්‍රම යොදා ගනිමින් මෙම වැඩසටහනට සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කෙරේ.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

03. වර්තමානයේ පවතින කොරෝනා - කොවිඩ් 19 අධි වසංගත තත්ත්වය හේතුවෙන් දිවයින් පුරා වෙසෙන ජනතාව මහත් අසීරු තත්ත්වයකට පත්වී ඇති අතර සමෘද්ධිලාභීන් සහ අඩු ආදායම්ලාභීන් වෙත ඇති කරන බලපෑමද අතිමහත් බව අප දන්නා කරුණකි. එබැවින් මෙයට එක් පිළියමක් වශයෙන් කඩිනම් ගෙවතු වගා සංවර්ධන වැඩසටහනක් මේ වන විට සැලසුම් කර ඇත.

04. මේ යටතේ සමෘද්ධිලාභීන්, අඩු ආදායම්ලාභීන් සහ සමෘද්ධි බැංකු සාමාජිකයන්ගේ ගෙවතු සංවර්ධනය කෙරෙන අතර ආරම්භයේ දී දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී වසමකින් ම සුදුසුම ගෙවතු 10 ක් සංවර්ධනය කළ යුතු වේ. මෙහි **<u>පළමු පියවර ලෙස 2020.03.26 දින සෑම ග්‍රාම නිලධාරී වසමකින් ම එක් ගෙවත්තක් හෝ මූලික බිම් සකස් කිරීමේ කටයුත්තක් ආරම්භ කළ යුතු වේ.</u>** බීජ හා රෝපණ ද්‍රව්‍ය කඩිනමින් ලබාදීමට කෘෂිකර්ම අමාත්‍යාංශය එකඟතාවය එල කර ඇති බැවින් එම ද්‍රව්‍ය ඔබ දිස්ත්‍රික්කයට ඉදිරියේදී ලබාදීමට කටයුතු කරනු ඇත.

05. මීට අමතරව ඔබ ප්‍රදේශයේ ඇති පුරන් කුඹුරු අස්වැද්දීමේ කටයුතු, වගා නොකළ ඉඩම් වල දේශීය ආහාර වගා කිරීම වැනි කටයුතු මඟින් මෙම උද්ගතවී තිබෙන තත්ත්වයට යම් සහනදායී පිළිතුරක් ලබාගැනීමට හැකිවනු ඇත.

මෙම ව්‍යසනකාරී අවස්ථාවේදී කඩිනම් ගෙවතු වගා සංවර්ධනය තුළින් ජාතික මෙහෙවරකට දායක වීමට ඔබ සැමට හැකියාව ලැබෙනු ඇත.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත් :-

1. ලේකම්, කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
3. රාජ්‍ය ලේකම්, සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
4. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
5. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
6. සියළුම ප්‍රාදේශීය ලේකම්වරු - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
7. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
8. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
9. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
10. සමෘද්ධි බැංකු හා බැංකු සමිති පාලක මණ්ඩල සභාපතිවරුන් - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.
11. සමෘද්ධි ප්‍රජාමූල සමිති/ ප්‍රාදේශීය සංවිධාන සභාපතිවරුන් - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.